## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත

2018 මාර්තු මස 06 වන දින අධිකරණ ඇමතිතුමිය විසින් ඉදිරිපත් කරන ලදි. මෙය ගැසට් පත්‍රයේ පළ කරන ලද්දේ 2018 පෙබරවාරි මස 06 වන දිනය. 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

මේ පනතේ 6 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට එරෙහිව අධිචෝදනා මත පවරනු ලබන නඩු විභාග කිරීම හා තීරණය කිරීම ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයක් විසින් සිදු කරනු ලැබේ.

මේ පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ගරු කථානායකතුමා විසින් 2018 අප්‍රේල් 03 වන දින පාර්ලිමේන්තුවට දැනුම් දෙන ලදි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව මහාධිකරණ විනිසුරුවරුන් අතුරින් තිදෙනෙක් අගවිනිසුරු විසින් නම් කරනු ලැබේ. මේ පනතේ 6 වන උපලේඛනයේ සඳහන් නඩු විභාග කිරීම එම ත්‍රිපුද්ගල මහාධිකරණයට පැවරේ.

යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ හෝ රටින් පිට හෝ නැතහොත් ගුවන් යානයක හෝ නැවක සිදුකරනු ලබන වරදක් සම්බන්ධයෙන් අධිකරණ බලය ත්‍රිපුද්ගල මහාධිකරණයට පැවරේ. ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශකර ඇත්තේ 6 වන උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් වෙනත් යම් අධිකරණයක ඇති බලය අඛණ්ඩව බලාත්මක වන බව සැක දුරු වනසේ ප්‍රකාශ කළ යුතු බවය.

ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අධිකරණ බලය පිළිබඳව ද ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් වේ. ඒ අනුව, ඒ මහාධිකරණය, බස්නාහිර පළාත සඳහා පිහිටුවා ඇත්නම් කොළඹදී සහ අගවිනිසුරුවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන බස්නාහිර පළාතේ වෙනත් යම් ස්ථානයකදී පවත්වනු ලබන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

එසේම එම මහාධිකරණය වෙනත් යම් පළාතක් සඳහා පිහිටුවා තිබේ නම් අගවිනිසුරුවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් නම් කරනු ලබන එම පළාතේ යම් ස්ථානයක එම මහාධිකරණය ක්‍රියාත්මක විය යුතුය.

නීතිපතිවරයා විසින් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාවේ විධානය මත අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනත යටතේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු පැවරීමේදී ඒ පිළිබඳ විධානයක් ලබා ගැනීමට, ඒ වරද පිළිබඳ තොරතුරු අගවිනිසුරු වෙත යොමු කළ යුතුය.

යම් වරදක් සම්බන්ධයෙන් ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ අපරාධ නඩු පැවැත්විය යුතු යැයි අගවිනිසුරුවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් නිකුත් කරනු ලබන ආඥාවකින් එම වරද සම්බන්ධයෙන් නඩුව විභාග කරන ලෙස එම මහාධිකරණයට විධාන කළ හැක.

අගවිනිසුරුවරයා විසින් එසේ විධාන කරනු ලැබූ විටක, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ ඇති නඩු විභාග නීතිපතිවරයා හෝ අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් මත පැවැත්විය යුතුය.

එම නඩු ඉක්මණින් පවත්වා අවසන් කළ යුතුය.

අසාමාන්‍ය, අවස්ථානුගත කරුණු නොමැත්තේ නම්, නඩු විභාග ඉක්මණින් අවසන් කිරීම සඳහා දිනපතා විභාග කළ යුතුය.

මෙම මහාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු මියයාම, ඉල්ලා අස්වීම වැනි හේතු නිසා එහි කටයුතු කිරීම නතර වන අවස්ථාවක, අගවිනිසුරුවරයා විසින් ඒ වෙනුවට සති 2ක් තුළ වෙනත් මහාධිකරණ විනිසුරුවරයෙක් පත් කරනු ලැබේ.

"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" යන්නෙන්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2වන වගන්තිය යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අදහස් වේ.